# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2023 ජනවාරි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

## (Corporate & Personal Taxation)

**අයදුම්කරුවන්ට උපදෙස් (අවධානයෙන් කියවිය යුතුය)**

1) දී ඇති කාලය කියවීම සඳහා - විනාඩි 15 යි
උත්තර ලිවීම සඳහා - පැය 1 යි
2) සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.
3) ඉල්ලුම් කරන ලද මාධ්‍යයෙන් එක් භාෂාවකින් පමණක්, ඔබ වෙත සපයන ලද පොත් වල උත්තර ලියන්න.
4) ගණනය කිරීම සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.
5) වැඩසටහන් ගත කිරීම කල නොහැකි ගණක යන්ත්‍ර පමණක් භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.
6) අර්ථකථන සහිත කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.
7) ලකුණු 100 යි.

---

**A කොටස**

**මුළු ලකුණු 20, අනිවාර්ය ප්‍රශ්න 4**

1) උෂානි හා ටෙෂානි ශ්‍රී ලංකාව තුල ව්‍යාපාර ආරම්භ කිරීමට බලාපොරොත්තුවෙන් සිටි. 2017 අංක 24 දරණ දේශිය ආදායම් පනතේ විධිවිදාන අනුව පහත දේ පිළිබඳ ඔබගේ උපදෙස් පතයි.

a. බද්දට යටත් වන්නේ කවුරුන්ද? (ලකුණු 03)

b. ඔවුන්ගේ වාසිකභාවය ඒ සඳහා අදාල වන්නේ කෙසේද? (ලකුණු 02)

(මුළු ලකුණු 05)

2) "බදු පරිපාලනය නීතිමය එකඟතාවය දැක්වීමේදී ඉතා වැදගත් වේ"

a. තක්සේරු වසර 2021/2022 සඳහා ආදායම් බදු වාර්තාව සැපයිය යුතු දිනය කවදාද? (ලකුණු 02)

b. ලියාපදිංචි සැපයුම්කරුවෙකු එකතු කල අගය මත බදු (VAT) ගෙවිය යුතු දිනයන් දක්වන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

3) රවුනි විසින් කුරුණෑගල ප්‍රදේශයේ ඉඩමක් මාස තුනකින් මිලට ගැනිමට එකඟවිය. පසුව විකල්ප ක්‍රියාමාර්ග මගින් කොටසකින් ඇය අත්පත් කරගත් අතර ඉතිරි කොටස යෝජිත ගැණුම්කරුවන්ට විකුණා එයින් ලාභයක්ද ඇය ලැබීය.
ඔබ විසින් එම ඉපැයු ලාභය ව්‍යාපාර ලාභයක්ද යන්න ඩී.එස්. මහවිතාරණ එදිරිව දේශිය ආදායම් නඩුවට අනුව පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 05)

4) 2006 අංක 12 දරණ මුද්දර බදු විශේෂ විධිවිධාන පනත ශ්‍රී ලංකාව තුල මුද්දර බදු පැනවිම සඳහා ක්‍රියාත්මක වේ. ඒ අනුව,

a. මුද්දර බදු සඳහා අදාලවන ගණුදෙනු 3ක් ලැයිස්තුගත කරන්න. (ලකුණු 03)

b. මුද්දර බදු ගෙවනා ක්‍රම තුනක් ලැයිස්තුගත කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

JMC vLearning "your virtual learning partner"

## <u>B කොටස</u>
## මුළු ලකුණු 30, අනිවාර්ය ප්‍රශ්න 3

5) ටැක්ස්ට්කො (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකාව සහ ලෝකයේ විවිධ ප්‍රදේශවල සිටින ගණුදෙනුකරුවන්ට උපදේශන සේවා පවත්වන ශ්‍රී ලංකාවේ පිහිටවූ ආයතනයකි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයකු විසින් 2021/2022 වසර සඳහා ඔහුගේ නිගමන මත බදු පැහැරහැරීමේ නිවේදනයක් ආයතනයට එවා ඇත. ටැක්ස්ට්කො (පුද්ගලික) සමාගමේ බදු උපදේශයකු වන ඔබගෙන් පහත ගැටළු සඳහා පිළිතුරු අපේක්ෂා කරයි.

A)

a. මෙම බදු පැහැරහැරීමේ නිවේදනය සඳහා ගත හැකි නීතිමය ක්‍රියාමාර්ග කුමක්ද? (ලකුණු 01)

b. දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් පැහැර හැරි බදු අයකර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

B)

සමාගම විසින් ඔවුන් සතු ආයෝජන දේපලක් 2021 ජුලි 16 දින රු. 26,000,000 කට විකුණූ අතර, එම දේපල 2019 වසරේදී රු. 19,000,000 කට අත්පත් කරගෙන තිබූ අතර 2020 රු. 1,200,000 වැයකර අළුත්වැඩියා කර තිබුණි. විකිණීමේ බ්‍රෝකර් ගාස්තුව රු. 260,000 කි. ඔබ විසින්,

a. මෙම ගණුදෙනුව මත ඇතිවන ප්‍රාග්ධන ලාභය (ආයෝජන වත්කම් උපලබ්ධි මත) ගණනය කරන්න. (ලකුණු 04)

b. එම බදු මුදල සහ ඊට අදාල බදු වාර්තාව සැපයිය යුතු දිනය සඳහන් කරන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 10)

6) ඒ.ඒ.ටී. විභාග සමත් සාමාජිකයින් දෙදෙනෙකු වන පවන් සහ සමන් ව්‍යාපාර උපදේශන ගිණුම්කරණ ආයතනයක් පවත්වාගෙන යන පී.එස්. ඇසෝෂියේෂන් යන නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. හවුල් ව්‍යාපාර ගිවිසුම අනුව පහත කොන්දේසි සහ තොරතුරු ඔබට සපයා ඇත.

1. 2022 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා ශුද්ධ ලාභය රු. 7,345,200 කි.
2. පවන් සහ සමන් ලාභාලාභ 2:1 අනුපාතයට බෙදාගනී.
3. හවුල් ව්‍යාපාරයේ කටයුතු ක්‍රියාකාරීව මෙහෙයවන සමන් හට මාසිකව රු. 100,000 ක වැටුපක් හිමිවන අතර එම වැටුප ඉහත ලාභය ගණනයේදී අඩුකර ඇත.
4. ගිණුම් කාලය වශයෙන් රු. 700,000/- ඉහත ලාභය ගණනය කිරීමේදී අඩුකර තිබුණි.
5. ආයතනයේ 31/03/2022 දිනට පවතින දේපළ පිරියත උපකරණ පහත පරිදි වේ.

| | |
|---|---|
| 2019/20 අත්පත් කරගත් ගමන් සඳහා භාවිතා කරන වෑන් රථය | රු. 7,800,000 |
| 2020/21 අත්පත් කරගත් පරිගණකය | රු. 1,800,000 |
| 2021/22 අත්පත් කරගත් සන්නිවේදන උපකරණ | රු. 2,700,000 |
| 2021/22 අත්පත් කරගත් ගිණුම්කරණ මෘදුකාංග | රු. 800,000 |

ඔබ විසින්,

2021/2022 තක්සේරු වර්ෂය සඳහා පහත දෑ ගණනය කරන්න.

a) හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය බදු පෙර වර්ෂය සඳහා (ලකුණු 04)

b) හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු බද්ද (ලකුණු 02)

c) හවුල්කරුවන්ට හිමි ලාභ බෙදීයාමේ ප්‍රකාශනයක් (ලකුණු 04)

(මුළු ලකුණු 10)

JMCvLearning "your virtual learning partner"

7) ජේ.එම්. කොන්සොලිඩේටඩ් සමාගම එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි සමාගමකි. ඔවුන් විසින් අපනයන නිෂ්පාදනවරුන්ට (SVAT) විකුණුම් සහ දේශිය නිෂ්පාදකයින්ට අවශ්‍ය උපාංග නිපදවනු ලැබේ.

2021 දෙසැම්බර් 31න් අවසන් කාර්තුව සඳහා සමාගමේ පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදි.

1. 2021 දෙසැම්බර් 31න් අවසන් කාර්තුවේ විකුණුම් විස්තර පහත පරිදි වේ.
   අපනයන නිෂ්පාදකවරුන්ට (SVAT) විකුණුම් රු. 30,000,000
   දේශිය නිෂ්පාදකයින්ට විකුණුම් රු. 45,425,000

2. සමාගම විසින් පහත එකතු කල අගය මත යෙදවුම් බදු කාර්තුව තුලදී ගෙවා තිබුණි.

| | රු. |
|---|---:|
| ආනයනික අමුද්‍රව්‍ය මත | 2,250,000 |
| නිෂ්පාදන යන්ත්‍ර අළුත්වැඩියා මත | 60,000 |
| ගමන් සඳහා භාවිතා වන මෝටර් රථ අළුත්වැඩියා මත | 48,000 |

3. SVAT බදු බැරපත් නිසියාකාරව ලැබී තිබුණි.
4. සමාගම විසින් භාවිතා කල පරිගණක යන්ත්‍ර රු. 1,420,000 කට විකුණා තිබුණි.
5. පසුගිය කාර්තුවෙන් ඉදිරියට ගෙනා හිලව් නොකළ යෙදවුම් බදු රු. 48,000
6. මාසික වාරික වශයෙන් ගෙවා තිබූ එකතු කල අගය මත බදු රු. 800,000

ඔබ විසින්,
සමාගමේ 2021 දෙසැම්බර් 31න් අවසන් කාර්තුව සඳහා ගෙවිය යුතු/(වැඩිපුර ගෙවූ) එකතු කල අගය මත බද්ද තක්සේරු කරන්න.

(ලකුණු 10)

JMC vLearning "your virtual learning partner"

## C කොටස

**මුළු ලකුණු 50, අනිවාර්ය ප්‍රශ්න 2**

8) ඉලෙක්‍රෝම් (පුද්ගලික) සමාගම විදුලි උපාංග නිෂ්පාදනය කර මෙරට හා විදේශ වෙළඳපල තුල විකුණුම් සිදුකරන සමාගමකි.

2022 මාර්තු 31න් අවසන් වසරේ මූල්‍ය ප්‍රකාශන වල පහත තොරතුරු ඔබට සපයා ඇත.

1. සමාගමේ පිරිවැටුම

| | රු. |
|---|---|
| අපනයනය මත | 628,000,000 |
| දේශීය විකුණුම් මත | 175,400,000 |

2. සමාගමේ 2022 මාර්තු 31න් අවසන් වසර සඳහා බදු පෙර ලාභය රු. 81,341,400

3. එම ලාභය තුල අන්තර්ගත අනෙකුත් ආදායම්,

| | රු. |
|---|---|
| ආයෝජන වත්කම් කුලිය | 1,800,000 |
| ස්ථාවර තැන්පතු පොලි | 1,000,000 |
| යන්ත්‍ර ඉවත්කිරිමේ ලාභය | 665,000 |

4. අයකල ආයතන පරිපාලන වියදම් තුල ඇතුලත් වියදම් කිහිපයක් පහත දැක්වේ.

- ක්ෂය වියදම් රු. 6,320,000
- කොවිඩ් අරමුදල (Covid 19) සඳහා දැරූ භාණ්ඩ පරිත්‍යාගය රු. 1,420,000
- අධ්‍යක්ෂකගේ විදේශ ගමන් වියදම්
  - ගණුදෙනුකරුවන් හමුවීම සඳහා රු. 1,420,000
  - පුද්ගලික විනෝද සංචාරය සඳහා රු. 2,150,000
- පාරිතෝෂික සඳහා වෙන්කිරීම් රු. 780,000
- කුලියට දුන් දේපල සඳහා අළුත්වැඩියා රු. 97,000

5. විකුණුම් හා බෙදාහැරිමේ වියදම් තුල පහත වියදම් ඇතුලත් වේ.

- ඉහත ලාභයට ගැලපු බොල්ණය
  - ණයගැතියන් මත බොල්ණය රු. 445,000
  - සේවක ණය කපා ගැනිම රු. 380,000
- විදේශ ප්‍රචාරණ වියදම රු. 1,472,000
- විකුණුම් කළමනාකරුවන් සඳහා සංග්‍රහ වියදම රු. 750,000

6. මූල්‍ය වියදම්,

| | රු. |
|---|---|
| සමාගමේ බැංකු අයිරාව | 1,756,000 |
| අධ්‍යක්ෂගේ නිවාස ණය මත පොලි | 710,000 |

JMC vLearning
"your virtual learning partner"

7. අතිරේක තොරතුරු පහත පරිදි වේ.

i. සමාගමේ 2022 මාර්තු 31 දිනට පැවති වත්කම්

| වත්කම් | ගත් වර්ෂය | පිරිවැය රු. |
|---|---|---|
| ආයෝජන දේපල (ඉඩම) | 2015/16 | 10,000,000 |
| ගොඩනැගිලි 1 | 2018/19 | 7,000,000 |
| ගොඩනැගිලි 2 | 2020/21 | 8,200,000 |
| අධ්‍යක්ෂක භාවිතා කල කාර් රථය | 2021/22 | 12,000,000 |
| ප්‍රවාහන ලොරි රථය | 2021/22 | 8,000,000 |
| යන්ත්‍ර | 2020/21 | 6,700,000 |
| පරිගණකය | 2018/19 | 720,000 |
| පරිගණකය | 2020/21 | 1,250,000 |
| ලී බඩු | 2018/19 | 800,000 |
| පරිගණකය මෘදුකාංග | 2021/22 | 1,950,000 |

- පරිගණකය මෘදුකාංග සඳහා වසර 4ක ප්‍රයෝජනවත් කාලයක් ඇස්තමේන්තු කර ඇත.

- ඉහත තොරතුරු වලට අමතරව 2019/20 රු. 2,750,000 මිලට ගත් යන්ත්‍රයක් නව යන්ත්‍ර සඳහා සඳහා 2021/22 වසරේදි රු. 2,360,000 කට විකුණා දැමූ අතර එම ගණුදෙනුව මත ලාභය ඉහත ලාභයේ අන්තර්ගතව ඇත.

ii. වසරේ පාරිතෝෂික ගෙවීම් රු. 1,450,000

iii. පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙනා බදු සඳහා ගණනය කල වෙළඳ අලාභය රු. 6,850,000 විය.

iv. කාර්තුමය වශයෙන් ගෙවූ ආදායම් බදු (ස්වයං තක්සේරුව) රු. 6,000,000 කි.

ඔබ විසින්,
2021/2022 තක්සේරු වර්ෂය සඳහා පහත දෑ තක්සේරු කරන්න.

a) තක්සේරු වන ආදායම
b) බදු අයකල හැකි ආදායම
c) දල ගෙවිය යුතු බද්ද
d) ගෙවිය යුතු ඉතිරි බද්ද

(කිසියම් වියදමක් ඉඩදීම හෝ නොදීම පැහැදිලිව දැක්විය යුතුය)

(ලකුණු 25)

JMC vLearning "your virtual learning partner"

9) කවීෂ මහතා වරලත් ඉංජිනේරුවරයෙකු වන අතර ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙලේ ඉදිකිරීම් සමාගමක ක්ෂේත්‍ර ඉංජිනේරුවරයෙකු ලෙස සේවය කරයි.

2021/2022 තක්සේරු වර්ෂය (මින්මතු වර්ෂය) සඳහා පහත තොරතුරු ඔබට සපයා ඇත.

1. සේවා නියුක්ති ආදායම් විස්තර,

   - මාසික දල වැටුප රු. 300,000
   - 2020/21ට අදාල හිඟ වැටුප් වර්ධකය 2021/22 දී ලැබුණා රු. 300,000
   - එන්ජින් ධාරිතාව 1,500 වන මෝටර් රථයක් ඉන්ධන සමඟ ආයතනය විසින් ඔහුට ලබාදී ඇත.
   - ඔහුගේ පුතාගේ පාසැල් ගාස්තුව සේවායෝජක ගෙවා තිබු අතර එය රු. 180,000ක් විය.
   - සියළු සේවකයන්ට පොදු සෞඛ්‍ය ප්‍රතිලාභ ක්‍රමයක් ආයතනයේ ඇති අතර එයින් වසරේදී ඔහු රු. 300,000ක මුදලක් ලබාගෙන තිබුණි.
   - ඔහුගේ අනුමැතිය මත සේවායෝජක වැටුපෙන් අඩුකර යැවු අත්තිකාරම් පුද්ගල බද්ද (APIT) රු. 36,000 කි.

2. ඔහුගේ තවත් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු ද වන අතර 2021/2022 වසරේ එම හවුල් ව්‍යාපාරයේ ලද ලාභ කොටස රු. 2,300,000 ක් වු අතර ඒ මත හවුල් ව්‍යාපාරය රු. 108,000 හවුල් ව්‍යාපාර බදු කොටස ඔහුට අදාලව ගෙවා තිබුණි.

3. ඉලෙක්ට්‍රොනික භාණ්ඩ අලෙවිසැලක් ද ඔහු පවත්වාගෙන යන අතර 2021/2022 වසර සඳහා එහි ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ.

| | රු. | | රු. |
|---|---|---|---|
| ගැණුම් | 4,100,000 | පිරිවැටුම | 7,250,000 |
| සේවක වැටුප | 900,000 | | |
| කුලිය | 300,000 | | |
| විදුලිය | 18,000 | | |
| ජලය | 7,000 | | |
| දුරකතන | 12,000 | | |
| අනිකුත් ආයතනික වියදම් | 112,000 | | |
| ක්ෂය | 200,000 | | |
| රජයේ පාසලට කල පරිත්‍යාග | 50,000 | | |
| ශුද්ධ ලාභය | 1,551,000 | | |
| | 7,250,000 | | 7,250,000 |

මෙම ව්‍යාපාරය සතුව පැවති 2020/21 රු. 800,000 මිලට ගත් පරිගණකය හැර අනිකුත් සියළු වත්කම් සඳහා සම්පූර්ණයෙන් ප්‍රාග්ධන දීමනා ලබාගෙන තිබුණි.

4. කවීෂ තමාගේ නිවසේ බිම් මහල මාසිකව රු. 60,000 කට කුලියට දි තිබුණි. වසරේදී කිසිදු අළුත්වැඩියාවක් කර නොතිබු අතර, කුලීකරු සොයා දුන් බ්‍රෝකර්වරයාට රු. 60,000 ක ගාස්තුවක් ගෙවා තිබුනි.

5. වාණිජ බැංකුවක ඇති ස්ථාවර තැන්පතුවක් මත රු. 360,000 ක පොලියක් ඔහුට ලැබී තිබුනි.

6. කවීෂ විසින් පහත ගෙවීම් වසරේ සිදුකර තිබුනි.

- කොවිඩ් අරමුදල සඳහා පරිත්‍යාග රු. 100,000කි.
- අවශ්‍ය අයට රැකවරණය සපයන අනුමත ආයතනයකට පරිත්‍යාග රු. 100,000 කි.
- නිවාස ණය මත පොලි ගෙවීම් රු. 240,000 කි.
- ස්වතක්සේරු බදු ගෙවීම් රු. 140,000 විය.

ඉහත තොරතුරු ඇසුරෙන්,

ඔබ විසින් කල යුතු දෑ:

2021/2022 තක්සේරු වර්ෂය සඳහා කවීෂ මහතාගේ පහත සඳහන් දෑ තක්සේරු කරන්න.

a) බදු අයකල හැකි ආදායම

b) ගෙවිය යුතු දල ආදායම් බද්ද

c) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද සහ

d) බදු නිදහස් ආදායම් (0000 නම්)

(ලකුණු 25)

JMC vLearning "your virtual learning partner"